සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන

## "අදිති"

12

පැය 01 යි මිනි 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**01. පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.**

ඉස්කෝලේ ඇරිලා ගෙදර එද්දී ළමයෙකුට කෙසෙල් ලෙල්ලක් පෑගුණා. ළමයා ලිස්සලා වැටෙන්න ගිහින් අනූනවයෙන් බේරුණේ. පාරේ කෙසෙල් ලෙලි දාන්න හොඳ නැති බව ගුරුතුමිය දවසක් කිවුවා. මට ඒ වෙලාවේ ඒක මතක් වුණා. මම ඉක්මනට දුවලා ගිහින් ඒ කෙසෙල් ලෙල්ල ළඟ තිබුණු කසළ බඳුනට දැම්මා. ගෙදර ඇවිත් මම ඒ සිද්ධිය චිත්‍රයට නැඟුවා. මාමාට පෙන්නුවා. පාට කරලා පත්තරේට යවමු කියලා මාමා කිවුවා. මට හරි සතුටුයි. මම චිත්‍රය පාට කළා.

- **ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරා ගෙන තිත් ඉරි මත ලියන්න.**

i. ළමයෙකුට කෙසෙල් ලෙල්ල පෑගුණේ කුමන අවස්ථාවක දී ද?

..............................................................................................................................

ii. පාරේ කෙසෙල් ලෙලි දාන්න හොඳ නැති බව කියා දුන්නේ කවු ද?

..............................................................................................................................

iii. ඡේදයේ සඳහන් ඉගි වැකිය තෝරා ලියන්න. ..............................................................

iv. චිත්‍රය බලලා මාමා යෝජනා කළේ කුමක් ද?..........................................................

v. 'පාසල' යන අර්ථය දීමට ඡේදයේ යෙදී ඇති වචනය සොයා ලියන්න

..............................................................................................................................

vi. ඡේදයේ සඳහන් ළමයා කළ යහපත් ක්‍රියාකාරකම කුමක් ද?

..............................................................................................................................

**02. අතීත කාල බහුවචන ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

i. කළෙමු      ii. කරමු      iii. ගියෙමි

**03. පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

i. යහළුවා හා යෙහෙළිය තෑගි දෙති ( )

ii. අලියා, ඇතින්න හා අලි පැටියා කැලයට යති. ( )

iii. සරුංගලය ඉහළ අහසේ පා වුණේ ය. ( )

vi. කුරුල්ලෝ කැදලි කරා පියාඹති ( )

v. ඌ කැලේ සතුන්ට නායකත්වය සපයයි ( )

**04. පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අර්ථය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) i. අග්ගළා    ii. අග්ගලා    iii. අග්සලා

(2) i. කනගාටුව    ii. කණගාටුව    iii. ඛනගාටුව

(3) i. බරපථල    ii. බරපතළ    iii. බරපතල

05. පහත සඳහන් වචනවල පිල්ලම් රහිත වචනය යටින් ඉරක් අඳින්න.

i. ඖෂධ ii. ගෞරවය iii. නෞකාව

06. පහත සඳහන් වාක්‍යයේ ඇති කර්ම පදය සොයා යටින් ඉරක් අඳින්න.

සීයා කුඹුර කොටයි

07. පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.

i. අහල ............................. ii.විහිළු .................................

08. යමක් කිරීමට පෙර සිතා බලන්න. යන අර්ථයට ගැළපෙන ආප්තෝපදේශය ලියන්න.

..........................................................................................................................................................

09. පහත සඳහන් කවියේ ඇති උපමාව තෝරා ලියන්න.

පොතේ අකුරු පේළි වගේ - දිගින් දිගට පෙළ ගැහිලා
රජ පෙරහැර යනව ද ඔය - කියන්න පොඩි කූඹියනේ

..........................................................................................................................................................

10. 'ඈ පාසල් යයි' යන වැකිය අතීත කාල බහු වචනයට හරවා ලියන්න


..........................................................................................................................................................

11. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න



i.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| c | | | | | p | | | | | r |



ii.

| | | | | |
|---|---|---|---|---|
| t | | | i | |

12. පහත දී ඇති වචනය නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i. I / out / May / go ? - .....................................................................................

ii. everyday / I / plants / the / water- .....................................................................................

13. එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

i. potatoes - .....................................................................................

ii. coconuts - .....................................................................................

14. i. 'අදිපර්' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න

..........................................................................................................................................................

ii. ඔයාට වතුර ඕනේද? යන වැකිය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

..........................................................................................................................................................

- **පහත ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

15. '**අනූදහස් නවය**' යන සංඛ්‍යාව හින්දු අරාබි ඉලක්කමින් ලියන්න.

.............................................................................................................................................

16. පහත සංඛ්‍යාව ස්ථානීය අගය අනුව විහිදුවා ලියන්න.

7029 = .................+ ....................+ ......................+ ........................

17. සංඛ්‍යා රටාවේ හිස්තැන්වලට ආ යුතු සංඛ්‍යා ලියන්න.

............., 48 , 53, 58, ................

18. '19' යන හින්දු අරාබි සංඛ්‍යාව රෝම ඉලක්කමින් ලියන්න.

.............................................................................................................................................

19.

| 3 | 4 |
|---|---|
| 0 | 5 |


කොටුව තුළ ඇති ඉලක්කම් ඇසුරෙන් ලිවිය හැකි විශාලම සංඛ්‍යාව සහ කුඩාම සංඛ්‍යාව අතර වෙනස කීය ද?

.............................................................

20. පහත සංඛ්‍යා තුන අවරෝහණ ක්‍රමයට නැවත ලියන්න.

18689, 81689, 18986 .............................................................

21. පෙරවරු 12.50ට දුම්රිය පිටත් වීමට නියමිතය. දුම්රිය පිටත් වීමට නියමිත වේලාව සම්මත ඔරලෝසු වේලාවෙන් ලියා දක්වන්න. .............................................................

22. 

රූපයේ අඳුරු කළ කොටසට අමතරව තවත් කොටස් දෙකක් අඳුරු කළේ නම් අඳුරු කර ඇති මුළු කොටස් ගණන භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.............................................................

23. ශාන්ත ජෝශප් විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ සිසුන් 1308ක් ඉගෙනුම ලබන අතර ද්විතීක අංශයේ සිසුන් 2196ක් ඉගෙනුම ලබන්නේ නම්, ද්විතීක අංශයට වඩා ප්‍රාථමික අංශයේ කොපමණ සිසුන් ප්‍රමාණයක් අඩුවෙන් ඉගෙනුම ලබන්නේ ද? .............................................................

24. මීටර් 7ක් දිග ලණුවකින් මීටර 3 සෙන්ටිමීටර් 60ක ප්‍රමාණයක් කපා ඉවත් කළේ නම් ඉතුරු ලණු කැබැල්ලේ දිග කොපමණ ද? .............................................................

25. $4kg\ 500g$ක් බර වට්ටක්කා ගෙඩියකින් $450g$ක් $300g$හා$150g$ බැගින් කැබැලි 3ක් විකුණුවේ නම් ඉතුරු වට්ටක්කා කැබැල්ලේ බර සොයන්න. .............................................................

26. රියෝන් පලතුරු බීම 2l කින් සමාන ප්‍රමාණයක් අල්ලන බෝතල් 10 කට බීම පුරවා භාජනය හිස් කරයි. එවැනි කුඩා බෝතල් 3ක් ගන්නා අයෙකුට අමතරව $75ml$ක කුඩා බෝතලයක් නොමිලේ ලබා දෙයි. බෝතල් 3ක් මිලට ගත් අයෙකුට ලැබෙන මුළු බීම ප්‍රමාණය කොපමණ ද? .............................................................

27. පොත් 515ක් රාක්ක 5කට සමානව අසුරන ලදී. එක් රාක්කයක ඇති පොත් සංඛ්‍යාව කීය ද?


.............................................................

28. A නගරයේ සිට B නගරය හරහා C නගරයට ඇති දුර 20km 550m කි. A සිට B තෙක් ඇති දුර 8km 750m ක් නම් B සිට C නගරයට ඇති දුර කොපමණ ද?

.............................................................

29. **පහත සඳහන් ප්‍රස්තාරය දෙස බලා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

පහත ප්‍රස්තාරයේ දැක්වෙන්නේ ශාන්ත ජෝශප් විද්‍යාලයේ 4D ශ්‍රේණියේ සිසුන්ගේ උපන් මාස දැක්වෙන තීර ප්‍රස්තාරයයි.




i. දී ඇති මාස හතරෙහි උපන්දින යෙදී ඇති මුළු සිසුන් ගණන කීය ද?

.............................................................

ii. වැඩි ම සහ අඩු ම උපන් දින යෙදී ඇති මාස පිළිවෙළින් දක්වන්න.

.............................................................

- **ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් ප්‍රශ්නවලට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. ශාකයක වැඩියෙන් ම මල් දැක ගත හැකි වන්නේ,
    1. හොඳින් හිරු එළිය ලැබෙන අතුවල
    2. හිරු එළිය නොලැබෙන අතුවල
    3. ශාකයේ සෑම අතුවලම

31. මලක ආවරණ පත්‍ර වශයෙන් හඳුන්වන්නේ,
    1. නටුව  2. මල්පෙති  3. මණිපත්‍ර

32. ඉතා සැහැල්ලු බරින් අඩු බීජ රාශියක් ඇති ගෙඩියක බීජ ව්‍යාප්තිය බහුලව සිදුවිය හැක්කේ,
    1. සතුන් මඟින්
    2. පිපිරී සුළඟට ගසා ගෙන යාමෙන්,
    3. පුපුරා යාමෙන්

33. රාජ්‍ය ලාංඡනයේ සඳ දක්වා ඇත්තේ,

1. පුන්කලසට වම් පසින්
2. පුන්කලසට දකුණු පයින්
3. පුන්කලසට උතුරු දෙසින්

34. මධ්‍යම පළාතට මායිම් නොවන පළාතක් වන්නේ,

1. උතුරු මැද පළාත  2. දකුණු පළාත  3. වයඹ පළාත

35. ශරීර වර්ධනය කරනු ලබන ආහාර කාණ්ඩය පමණක් ඇති පිළිතුර තෝරන්න.

1. මස්, බිත්තර, බත්  2. මස්, මාළු,පරිප්පු  3. මස් , මාළු, අල

36. අතු අග ගෙඩි හට ගන්නා ශාකයක් වන්නේ,

1. දෙල්  2. කොස්  3. බිලිං

37. සූර්ය ග්‍රහණයක් සිදුවිය හැකි දිනයකි.

1. පුර පසළොස්වන පෝය දින
2. පුර අටවක පෝය දින
3. අමවාක පෝය දින

38. ශාක භක්ෂක හා මාංශ භක්ෂක සතුන් දෙදෙනෙකු පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. ලේනා - නරියා  2. ගිරවා - මකුළුවා  3. ඉබ්බා - බල්ලා

39. 'මහ සිකුරුදා' දිනය සමරනු ලබන්නේ,

1. බෞද්ධ බැතිමතුන්  2. ඉස්ලාම් බැතිමතුන්  3. කතෝලික බැතිමතුන්

40. ඉපනැල්ල වශයෙන් ගොවියා හඳුන්වන්නේ,

1. කපා ගත් ගොයම් ගසේ මුල් කොටසට
2. පාගා ගත් ගොයම් ගසේ ඉතිරි කොටසට
3. කමතේ ගොඩ ගසන ලද පිදුරු ගොඩට

41. ඔබේ නිවසට නිතර පැමිණෙන රාජ්‍ය නිලධාරිණියක් වන්නේ,

1. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය
2. ප්‍රජා පොලිස් නිලධාරිණිය
3. සංවර්ධන නිලධාරිණිය

42. අනාරක්ෂිත ස්ථානයකට උදාහරණයක් වන්නේ,

1. ගේට්ටුවක් සහිත දුම්රිය හරස් මාර්ගය
2. පොලිස් නිලධාරියෙකු රැඳී සිටින පදිකයින් මාරුවන ස්ථානය
3. ගේට්ටුවක් නොමැති ව දුම්රිය මඟ හරහා වැටී ඇති අතුරු මාර්ග


43. අධික පැණි රස හා පිෂ්ටය සහිත ආහාර ගැනීමෙන් වැළඳෙන රෝගයකි.

1. දියවැඩියාව  2. අධික රුධිර පීඩනය  3. අම්ලපිත්ත රෝගය


44. බොත්තම් කාසයක් මසා ගැනීමට සුදුසු මැහුම් ක්‍රමයක් වන්නේ,

1. කතිර මැස්ම  2. දම්වැල් මැස්ම  3. බ්ලැන්කට් මැස්ම


45. බල්බය දැල්වෙන අවස්ථාවක් දැක්වෙන්නේ කුමන ඇටවුමෙන් ද?




1.




2.




3.

46. නූතන සන්නිවේදන ක්‍රමයක් ලෙස මෑතක දී ජනප්‍රිය වූ මාධ්‍යයකි,

1. රූපවාහිනිය  2. ගුවන්විදුලිය  3. විද්‍යුත් තැපෑල

47.



මෙහි දැක්වෙන අතීත කලා නිර්මාණය හඳුන්වනු ලබන්නේ

1. ලියවැල නමින්  2. පලා පෙති නමින්  3. බෝපත් නමින්

48. මින්නේරිය වැව සහ තිසාවැව කරවූ රජවරුන් වන්නේ,

1. පණ්ඩුකාභය රජු හා වසභ රජු
2. මහසෙන් රජු හා ධාතුසේන රජු
3. මහසෙන් රජු හා දේවානම්පියතිස්ස රජු

49. වැටකුළු කරලක ඇති දාර ගණන වන්නේ,

1. 10කි.  2. 12කි.  3. 16කි.

50. නාය යන ස්ථානයකින් පුද්ගලයින් හට වහාම ඉවත්වන ලෙස දැක්වීමට සුදුසු සන්නිවේදන මාධ්‍ය වන්නේ,

1. ගුවන් විදුලිය  2. රූපවාහිනිය  3. ශබ්ද විකාශන යන්ත්‍රය

51. සෙම සහිත රෝගියෙකුට පානය කිරීමට සුදුසුම කොළ කැඳ වර්ගයක් වන්නේ,

1. කෝවක්කා කැඳ  2. මුකුණුවැන්න කැඳ  3. යකිනාරං කැඳ

52. පනාමල් සෑදෙන්නේ කුමන ශාකයේ ද?

1. කොස්  2. දෙල්  3. මුරුංගා

53. සියලුම ආගමිකයින් පොදුවේ සහභාගිවන ආගමික පෙරහැරකි.

1. දළදා පෙරහැර
2. මිහිඳු පෙරහැර
3. රුහුණු කතරගම පෙරහැර

54. ජය ගඟ හෙවත් යෝධ ඇළ ආරම්භ වන්නේ,

1. මොරගහකන්ද ජලාශයෙන්
2. කලාවැවෙන්
3. නාච්චාදූව වැවෙන්

55. ජාත්‍යන්තර ප්‍රමිති ලාංඡනය වන්නේ මින් කුමක් ද?

1. SLS 2. ISO 3. SOS

56. කිවුල් ජලය දැකිය හැක්කේ,

1. ගංගාවල 2. ළිංවල 3. කලපුවල

57. පරිසර හිතකාමී කෘමී මර්දන දියරයක් සාදා ගත හැකි ශාකයකි.

1. ගස් ලබු 2. කොහොඹ 3. කුඹුක්

58. 

ඉහත පිංතූරයේ සිටින කීර්තිමත් පුද්ගලයා වන්නේ,

1. ආචාර්ය ආනන්ද කුමරස්වාමි මහතා
2. ආචාර්ය පොන්නම්බලම් රාමනාදන් මහතා
3. ආචාර්ය ටී.බී. ජයා මහතා

59. ගෙදැල්ල කරුව භාවිතා කරන්නේ,

1. ධීවරයා 2. වඩුවා 3. හේන් ගොවියා

60. පහත සඳහන් පිංතූරය දෙස බලා අර්ථවත් වාක්‍ය තුනක් ලියන්න. අක්ෂර වින්‍යාසය හා උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු අතර සෑම වැකියක ම අවම වශයෙන් වචන 5ක් වත් තිබිය යුතුය.



1. ......................................................................................................................................................
......................................................................................................................................................
2. ......................................................................................................................................................
......................................................................................................................................................
3. ......................................................................................................................................................
......................................................................................................................................................